වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2024

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
மாணிக்கம் மற்றும் ஆபரண ஆராய்ச்சி மற்றும் பயிற்றுவிப்பு நிறுவனம்
GJRTI Gem and Jewellery Research and Training Institute

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

හා

අභ්‍යාස ආයතනය

වාර්ෂික වාර්තාව

2024

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා
අභ්‍යාස ආයතනය
"රුවන් සෙවන"
නො:73/5/A,
වැලිවිට
2025.02.27

ගරු අමාත්‍යතුමා
කර්මාන්ත අමාත්‍යාංශය
තැ.පෙ 570,
73/1
ගාලු පාර,
කොළඹ-03

ගරු අමාත්‍යතුමනි,

<u>වාර්ෂික වාර්තාව 2024</u>

1971 අංක (2) 14 38 උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2024 වර්ෂය සඳහා වු මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තා
2. 2024 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන වාර්තාව.

මෙයට විශ්වාසි

ජී.ඩබ්.ඒ. රොහාන් ප්‍රනාන්දු මයා
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

දැක්ම

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම"

මෙහෙවර

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පීය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි "

අභිමතාර්ථ

" ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණය කර තිරසාර ලෙස ගොඩ ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම"

2.1. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2024 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

1	ජී.ඩබ්.ඒ. රොහාන් ප්‍රනාන්දු මයා	සභාපති මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය	අධ්‍යක්ෂ මණ්ඩල සභාපති 2024.12.27 සිට
2	කේ.එන්.පී. ජයරත්න මයා	අධ්‍යක්ෂ (වැ.බ) ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.04.01 සිට 2024.09.20 දක්වා
3	එස්.ජී.එල්. ප්‍රනාන්දු මයා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2022.12.08 සිට 2024.09.20 දක්වා
4	ජනක උදයකුමාර මයා	අධ්‍යක්ෂ ජනරාල් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023.12.28 සිට 2024.09.20 දක්වා
5	ආචාර්ය එස්. පෙරේරා	සභාපති භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික 2023.12.15 සිට 2024.02.26 දක්වා
6	එස්.ඒ.ඩබ්.කේ. ජයසේකර මයා	අධ්‍යක්ෂ (සැලසුම්) වැ.බ කර්මාන්ත අමාත්‍යාංශය	අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක 2022.01.31 සිට 2024.09.20 දක්වා

ඉහළ කළමණාකාරීත්වය

මහාචාර්ය පී.ඩබ්.ඒ. රොහාන් ප්‍රනාන්දු මයා
සභාපති
BSc (Hons), MPhil (Perad);
PhD (Mainz, Germany);
CGeol. (IGSL)

බී.පී.ආර්.ඩබ්. ගම්ලත් මහතා
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)/
අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)
B.Sc.(Phy-Sp),
M.Sc. in Gemmology (SL),
MGA(SL), FGA, MBA(Reading)

ආර්.එම්.එන්.පී.කේ ජයසිංහ මහතා
අධ්‍යක්ෂ(පර්යේෂණ)වැ.බ
B.Sc.(Geology), M.Sc.(GIS & RS),
M.Phil.(Reading)
MGS(SL), MGA(SL), MGIS(SL)

එස්.එල්.ජේ. මුහන්දිරම් මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය)
MPAcc(USJP),
B.com(Sp) Accountancy
(Hons) (USJP),CBA(ICASL),
Adv.Cer(Procurement)ICTAD)

එම්.ඒ.නදීකා චාමිනී මන්ත්‍රීරත්න මිය
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) වැ.බ
B.Tec.(Sp) Material Science ,
M.Sc (Nano Science Technology Reading)

3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය

3.1 අවස්ථා

❖ පර්යේෂණ හා පුහුණුව සඳහා වන ඉල්ලුම

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පුහුණු හා පර්යේෂණ කාර්යයන්හි සංවර්ධනය හා නියාමනය සඳහා පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය විසින් මේ වන විට මැණික් පතල් කැණීමේ සිට ජාත්‍යන්තර වෙළඳපොළ දක්වා ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම දක්වා අගය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය ආවරණය වන අයුරින් නව නිර්මාණකරණයට අවශ්‍ය කුසලතා හා දැනුම ලබා දීම උදෙසා පුහුණු හා පර්යේෂණ වැඩසටහන් දියත්කිරීමේ කාර්යයයේ නියලී සිටියි. ආයතනය විසින් මේ වන විටත් සහතික පත්‍ර මට්ටමේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා වූ විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන අයුරින් පුහුණු පාඨමාලා 21 කට ආසන්න සංඛ්‍යාවක් මධ්‍යස්ථාන 15 ක් හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ආයතනය බිහිවී දශක තුනකට ආසන්න කාලයක් තුල මෙම ආයතනයට අභියෝගයක් විය හැකි මට්ටමේ වෙනත් රාජ්‍ය හෝ පෞද්ගලික පුහුණු ආයතන බිහිවී නොමැති අතර ආයතනයට අභියෝගයක් විය හැකි මට්ටමේ පුහුණු ආයතන බිහිවීමේ ප්‍රවණතාවයක් ද වෙළඳපොළ තුල දක්නට නොලැබෙන බව හඳුනාගෙන ඇත. මේ අනුව තවදුරටත් මෙරට හා ජාත්‍යන්තර මැණික් වෙළඳපොළ සඳහා අනිකුත් රටවල් සමඟ තරගකල හැකි මට්ටමේ දැනුම ව්‍යාප්ත කල හැකි නිපුණතාවය ආයතනය සතුව පවතින බවට හඳුනා ගත හැකිවේ.

❖ තාක්ෂණික පහසුකම්

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා උසස් තාක්ෂණික නිපුණතාවයකින් යුතු පුහුණු ශ්‍රමිකයින් බිහිකිරීම සඳහා මෙන්ම පරිසර හිතකාමී මැණික් ගවේෂණ පර්යේෂණ කටයුතු සඳහා මෙන්ම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල නව නිෂ්පාදන හඳුන්වා දීමට හැකියාවක් සහිත පුළුල් යන්ත්‍ර සූත්‍ර උපකරණ මෙන්ම පරිගණක මෘදුකාංග ආයතනය සතුව ඇත. එසේම මෙම යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට හැකියාවත් සහිත දැනුමකින් යුතු පුළුල් පුහුණුවක් සහිත මානව සම්පතක් ද ආයතනය සතුවේ. ජත්‍යන්තර ප්‍රමිති මට්ටමින් යුතුව පුහුණු පාඨමාලා සඳහා උපයෝගී කර ගත හැකි පුළුල් පහසුකම් වලින් සමන්විත රත්නවිද්‍යාගාර , මැණික් කැපුම් පුහුණු ඒකක , පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ කිරීමේ පුහුණු පහසුකම් ඇතුළු ත්‍රිමාණ මුද්‍රණ තාක්ෂණය , වාත්තුකිරීම හා විද්‍යුත් ලෝහාලේපන තාක්ෂණික පහසුකම් ආයතනය සතුවේ. එසේම මැණික් කර්මාන්තයට අදාල පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරනු ලබන X-Ray Florescence Spectrometer , Magnetic Separator , specific gravity scale , Laser Diffraction Particle size analyser , Fourier – Transform Infrared Spectroscope , Raman Spectroscope , Ultraviolet-Visible Spectroscope වැනි නවීන යන්ත්‍ර උපකරණද ආයතනය සතුවේ.

❖ ආයතනික ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ අවස්ථා හා දියුණුව

පාර්ලිමේන්තු පනත මගින් මෙම ආයතනය පිහිටුවා ඇති මූලික අරමුණු වලින් ඔබ්බට ගිය සංවර්ධන ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ආයතනය සතුව පවතී. වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන ඉහල ප්‍රමිති මටටමකින් යුතු සහතික පත්‍ර ප්‍රදානෝත්සවයන් පැවැත්වීම , ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු පර්යේෂණ සමුළු පැවැත්වීම ආයතනයේ විද්‍යාර්ථීන්ගේ සංගමයක් ආරම්භ කර පවත්වා ගෙන යාම වැනි අවස්ථා රාශියක් ක්‍රියාත්මක කිරීමට ආයතනයට හැකියාව පවතී.

❖ කර්මාන්තයේ දියුණුව සඳහා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ දේශීය තිරසර , පරිසර හිතකාමී හා ආචාර විද්‍යාත්මක සංවර්ධනයක් ඇති කිරීම උදෙසා ආයතන සිය ක්‍රියාකාරකම් හැකිතාක් බාහිර ආයතන සමඟ සම්බන්ධ වී ඒකාබද්ධ සංධිය වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ඇත. මේ යටතේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, භූවිද්‍යා සමීක්ෂ හා පතල් කාර්යංශය , ජාතික විද්‍යා පදනම , කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පේරාදෙනිය , සබරගමුව සහ ඌව වෙල්ලස්ස වැනි විශ්ව විද්‍යාල මෙන්ම FGA , තායිලන්ත මැණික් ආයතනය (GTI) , පකිස්ථාන් රජය වැනි විදේශීය රාජ්‍ය හා ආයතන සමඟ ක්‍රියාත්මක වී මෙම වැඩසටහන් ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර තවදුරටත් සංවර්ධිත කර්මාන්තයක් උදෙසා විවිද බාහිර පාර්ශව සමඟ සංධිය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ආයතනය සතුවේ.

- ❖ ආයතනික ප්‍රචාරක වැඩසටහන්

ආයතනයේ පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් ප්‍රචාරණය හා දැනුවත් කිරීමේ කටයුතු සඳහා වඩාත් ප්‍රමුඛතාවයක් දී කටයුතු කරනු ලැබේ. මේ යටතේ වර්තමානයේ බහුල වශයෙන් ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලබන සමාජ මාධ්‍ය භාවිතා කරමින් ආයතනික වැඩසටහන් ප්‍රචාරණයට අවස්ථාව සලසා ගෙන ඇත. නමුත් මෙම කර්මාන්තයේ ස්වරූපය අනුව ඒ ඒ වයස් කාණ්ඩ , ප්‍රාදේශීය පදනම , නිරත වන වෘත්තීය හා කර්මාන්තයේ යෙදෙන්නනගේ අධ්‍යාපන මට්ටම් අනුව තවදුරටත් සාම්ප්‍රදායික දැනුවත් කිරීම හා ප්‍රචාරණ කාර්යන්හිද නිරතව සිටියි.

3.2. අභියෝග

- ❖ තාක්ෂණය ,යටිතල මූල්‍ය හා භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම.

මැණික් කර්මාන්තයට අදාල නිරන්තරව යාවත්කාලීන වන තාක්ෂණික දැනුම යන්ත්‍ර සූත්‍ර කර්මාන්තයේ නවීන ප්‍රවණතා සම්බන්ධයෙන් වන දැනුම මෙරට කර්මාන්තරුවන්ට යොමුවීමේ පසුගාමී තත්ත්වයක් දක්නට ලැබේ. එසේම ජාත්‍යන්තර දැනුම ලබා ගැනීමට අවශ්‍ය ආකාරයේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට යොමු වීමේ අවස්ථා අඩු මට්ටමක පවතී. පුහුණු පාඨමාලා සඳහා මෙන්ම පර්යේෂණ කටයුතු සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර පුහුණු උපකරණ භාවිත වීමේ ප්‍රවණතාවය අඩු මට්ටමක ඇති අතර ආයතනික සංවර්ධන කාර්යේදී අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම කෙරෙහි මෙම යටිතල පහසුකම් ප්‍රමාණවත් නොමැති වීම බාධාකාරී වී ඇත. එසේම ආයතනය සඳහාම වූ ස්ථිර ගොඩනැගිලි පහසුකම් නොමැති වීම ද සංවර්ධන කාර්යයේදී අඩුවක්ව පවතී. ආයතනයේ පුහුණු හා පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන පුහුණු ඒකක ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව සංවර්ධනය කල යුතු මට්ටමක පවතී. එසේම රත්න විද්‍යා රසායනාගාර පර්යේෂණ රසායනාගාර සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර සපයා ගත යුතු අතර මේ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගත යුතුව ඇත.

- ❖ මානව සම්පත් සංවර්ධනය මන්දගාමී වීම.

ආයතනික සේවක සැලැස්ම යටතේ අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව 136 ක් වන නමුත් මේ වන විට ආයතනය සතුව සිටිනුයේ සේවකයින් 60 ක් පමණි. මේ වන විට ආයතනයේ කටයුතු ප්‍රශස්ත හා ගුණාත්මක අයුරින් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සේවකයින් සංඛ්‍යාවක් ආයතනය සතුව නොමැති අතර ආයතනය පවත්වා ගෙන යාමට ප්‍රධාන වශයෙන්ම බලපානු ලබන තනතුරු කිහිපයකම පුරප්පාඩු පවතී. එසේම අධ්‍යාපනායතනයක සිටිය යුතුම උසස් අධ්‍යාපනයක් සහිත අධ්‍යයන කාර්ය මණ්ඩල හිගතාවයක් ද පවතින අතර අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා උපාධි මට්ටමේ පිරිසක් බඳවා ගත යුතුව ඇත. ආයතනයේ පර්යේෂණ හා පුහුණු ක්‍රියාකාරකම් සඳහා මේ වන විට වඩාත් ඉහල ඉල්ලුමක් පැවතියද මානව සම්පත් හිඟතාවය ආයතනික කටයුතු ප්‍රශස්ත අයුරින් කර ගෙන යාමට බාධාකාරී වී ඇති බැවින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වූ පුහුණු අවස්ථා සඳහා කාර්යය මණ්ඩලය යෙදවීමටත් පුරප්පාඩු සඳහා කඩිනමින් පිරිස් බඳවා ගැනීමේ කටයුතුත් සිදු කල යුතුව ඇත.

- ආයතනික කාර්යයන් ක්‍රියාක්මක කිරීමේ නෛතිකභාවය

ආයතනය ස්ථාපිත කරන ලද පනත ප්‍රකාරව ආයතනය වෙත පවරා ඇති බලතල හා ක්‍රියාකාරකම් වර්තමානය වන විට සංශෝධනයකට ලක් කල යුතු බව හදුනා ගෙන ඇත. ආයතනික ක්‍රියාකාරකම් සිදුකිරීමේදි මෙම සීමාවන් තුල කටයුතු කිරීමට සිදුවීම හේතුවෙන් ඇතැම් ක්‍රියාකරකම් ඉටු කිරීමේ අවස්ථා මගහැරී ගොස් ඇත. ඒ අනුව ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතුව අධ්‍යාපනායතන නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගත යුතුව ඇත. එසේම කර්මාන්තයට ප්‍රවිෂ්ඨ වන්නන් සඳහා ප්‍රමිතිගත අධ්‍යාපන මට්ටමක් නියම කල යුතු අතර කර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහාත් පරිසර හිතකාමී කර්මාන්තයක් උදෙසා සහ කර්මාන්තයේ නියුක්තවුවන්ගේ වෘත්තීමය භාවයක් සහිතව ආචාරධර්ම පද්ධතියකට අනුකුලව මෙම කර්මාන්තය ක්‍රියාත්මක කිරීම උදෙසාත් මෙම කර්මාන්තයට අදාල නිතිමය පසුබිම සකස් කර ගත යුතු අතර ඒ සඳහා වන නියාමන ක්‍රමවේදයක් සකස් කර ගත යුතුව ඇත.

- සම්පුර්ණ වී නොමැති අවශ්‍යතා

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ උසස් අධ්‍යාපනයක් සහිත ප්‍රවීණයින් පුහුණු හා පර්යේෂණ කාර්යයන් සඳහා තවදුරටත් සම්බන්ධකර ගැනිමේ අවශ්‍යතාවයන් පවති. එසේම කර්මාන්තයට මෙන්ම වෙළඳපොළ සඳහා ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන හඳුන්වා දීම සඳහා හා පරිසර හිතකාමී කැණීම් ක්‍රමවේද හා පර්යේෂණ අත්හදා බැලීම් සඳහා අවශ්‍ය නවින තාක්ෂණයෙන් ආයතනය සවිබල ගැන්වීම මන්දගාමී ස්වරුපයක පවතින අතර එය තිරසර හා ක්‍රමාණුකුල අයුරින් සංවර්ධනය කරගත යුතු මට්ටමක පවති.

4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

4.1. අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව1995 ජුලි 28 දිනැති හා අංක 882 දරණ ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවන ලදී.ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීම, වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරිමයි.

4.2. ආයතනයේ බලතල

ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ හා එම නිධි පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

4.2.1. ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ පිළිබඳ සමීක්ෂණයන් කිරීම

(අ) පිහිටීම.
(ආ) හඳුනා ගැනීම.
(ඇ) මැණික් ගල් අනර්ගීකරණය කිරීමේ ක්‍රම.
(ඇ) වෙනත් අදාල ක්ෂේත්‍රයන් හා අදාල රත්න විද්‍යාත්මක පර්යේෂණ කිරීම .

4.2.2 පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සෑදීම, මැණික් ගල් පිළිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

4.2.3 (අ) මැණික් කැපීම.
(ආ) ස්වරණාභරණ සෑදීම.
(ඇ) දියමන්ති ඇතුලු රත්න විද්‍යාව.
(ඈ) ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම.
(ඉ) මැණික් ගල් අනර්ගීකරණය
(ඊ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙනත් අදාළ අංශ පිළිබඳව පුහුණුවක් ලබා දීම.

4.2.4 වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම හා අදාල මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පල කිරීම.

4.2.5 ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසු කිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.

පුහුණු අංශය

5. පුහුණු අංශය

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රෙය් විධිමත් වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව වැඩි දියුණු කිරීම තුලින් ජාත්‍යන්තර වෙළඳපොළට ගැලපෙන උසස් හා ගුණාත්මක නිමි භාණ්ඩ නිෂ්පාදනය කල හැකි තාක්ෂණික නිපුණතාවයකින් යුතු පිරිස ප්‍රමාණාත්මකව වැඩි කිරීම සඳහා පුහුණු පාඨමාලා සංවර්ධනය , නව පාඨමාලා හඳුන්වා දීම , පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය , පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) තත්ත්වයන් හඳුන්වා දීම , Gem A (Gemmological Association of Great Britain) හි ප්‍රතිතනය කරන ලද පාඨමාලා ක්‍රියාත්මක කිරීම හා උපාධි මට්ටමේ සුදුසුකම් සංවර්ධනය කිරීම යනාදි කාර්යයභාරයක් රාශියක් ක්‍රියාත්මක කිරීමට 2024 වසරේදි කටයුතු කරන ලදි.

5.1. පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

ජාත්‍යන්තර වෙළඳපොළ තුල වෘත්තිමයභාවයක් නිර්මාණය වි ඇති සහ දිනෙන් දින ඉහල ඉල්ලුමක් සහිත විෂයය ක්ෂ්ත්‍ර හඳුනා ගනිමින් ඒ සඳහා ගැලපෙන පුහුණු පාඨමාලා 21 කට ආසන්න ප්‍රමාණයක විෂයමාලා තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිසන් සභාවේ (TVEC) ප්‍රමිති තත්ත්වයන්ට ගැලපෙන අයුරින් සවර්ධනය කර ඇත. තනි පුද්ගල අවශ්‍යතාවය අනුව සකසා හැදැරීය හැකි කෙටි කාලින පාඨමාලාවන් ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රාථමික , ද්විතීක හා තෘතිය මට්ටම් සියල්ල ආවරණය වන ආකාරයෙන් පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරමින් කර්මාන්තයේ ප්‍රධාන ක්ෂ්ත්‍ර දෙක වන මැණික් ක්ෂ්ත්‍රය හා ස්වර්ණාභරණ ක්ෂ්ත්‍රය සඳහා පුහුණු ලාභින්1334 ක් පුහුණුව සඳහා බඳවා ගැනීමට 2024 වසරේදි හැකියාව ලැබි ඇත. මේ යටතේ රු.මිලියන 33.88 ක ආදායමක් ආයතනයට උපයා දීමට කටයුතු කර ඇත.

	පුහුණු පාඨමාලාව	**2022** බඳවා ගත් සංඛ්‍යාව	**2023** බඳවා ගත් සංඛ්‍යාව	**2024** බඳවා ගත් සංඛ්‍යාව
01	මූලික රත්න විද්‍යාව	147	229	218
02	රත්න විද්‍යාව	148	240	204
03	දෙමුහුන් රත්න විද්‍යාව	22	22	16
04	මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අළෙවිකරණය	24	23	-
05	ගෙවුඩතාප පිරියම් කිරීම	102	212	117
06	මැණික් කැටයම් කැපීම	07	-	-
07	මැණික් කැපීම සහ ඔප දැමීම NVQ 3 / NVQ 4	235	429	400
08	මැණික් කැපීම සහ ඔප දැමීම දින 10	8	18	46
09	මැණික් මිල තක්සේරුකරණය හා අළෙවිකරණය	-	36	-
10	ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	69	80	53
11	පරිඝණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය	17	57	57
12	ස්වර්ණාභරණ නිෂ්පාදනය NVQ 4	25	138	105
13	විලාසිතා ආභරණ නිෂ්පාදනය	15	-	08
14	ආභරණ සඳහා ගල් බැඳිම	30	38	46
15	වාත්තුකරණය සහ විද්‍යුත් ලෝහාලේපනය	-	10	07
16	රත්න විද්‍යා ඩිප්ලෝමාව	13	23	40
17	ස්වර්ණාභරණ ඩිප්ලෝමාව	-	13	-
18	කෙටි කාලින පාඨමාලා	07	09	17
	මුළු එකතුව	**869**	**1577**	**1334**



වගුව 1 - ශිෂ්‍ය බඳවා ගැනීමේ වර්ධනය



වර්ෂය	ආදායම රු මි
2019	13.06
2020	8.2
2021	3.3
2022	12.86
2023	30.4
2024	33.88

වගුව 2 - ආදායම් වර්ධනය

5.1.1. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල වෘත්තීය සුදුසුකම තහවුරු කිරීම (RPL ක්‍රමවේදය යටතේ සහතික පත් නිකුත් කිරීම ආරම්භ කිරීම)

කර්මාන්තයට අදාලව විධිමත් අධ්‍යාපනයක් හා කුසලතා ඇතත් ඒ සඳහා වූ පිළිගත හැකි සහතික නොමැති , නමුත් කර්මාන්තයේ දැනුම හා පළපුරුද්ද සහිත ශිල්පීන්ට දේශිය හා විදේශිය පිළිගත් සහතිකයක් ලබා ගැනීම සඳහා අවස්ථාව සලසන පෙර ප්‍රවීණතා දැනුම පාදක කරගනිමින් අදාල ක්ෂේත්‍රයේ සුදුසුකම් සපුරා ගැනීම සඳහා Recognition of prior learning (RPL) 2024 අවස්ථාව සලසා දීමට කටයුතු කර ඇත. මෙමගින් ආයතනයේ ආදායම් දියුණු කර ගැනිමේ හැකියාව සැලසේ.

5.2. පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය

දිවයිනම ආවරණය වන අයුරින් ආයතනයේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන 15 ක් මෙම වසරේදී ද සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. කඩුවෙල , රත්නපුර , මහනුවර , අත්තනගල්ල , නිවිතිගල , යාපනය , මඩකලපුව , බදුල්ල , ලග්ගල , සේනපුර , මරදාන , රත්නපුර තරුණ සේවා සභාව , ගම්පොළ , ගාල්ල හා නාඋල එම මධ්‍යස්ථාන වේ.

5.3. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අධ්‍යාපන සංවර්ධනය

5.3.1. රත්න විද්‍යාව විෂයය සඳහා NVQ 5 / 6 ප්‍රතිතන මට්ටමට සංවර්ධනය කිරීම

රත්න විද්‍යාව විෂයය ක්ෂේත්‍රය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 / 6 ප්‍රතිතන මට්ටම (NVQ 5 / 6) ලබා ගැනීම සඳහා විෂයය නිර්දේශ සංවර්ධනය කර පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ හැකියාව සපුරා ගැනීමට කටයුතු කරනු ලැබිණි.

5.3.2. බ්‍රිතාන්‍ය මැණික් විද්‍යා සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් සපුරන පාඨමාලා ක්‍රියාත්මක කිරීම

මැණික් ක්ෂේත්‍රයේ විධිමත් වෘත්තීමයභාවය සනාථ කිරීමේ ජාත්‍යන්තර සුදුසුකමක් වන GEM –A (Gemmological Association of Great Britain) පාඨමාලාව හදාරා FGA (බ්‍රිතාන්‍ය රත්න විද්‍යා සංගමයේ සාමාජිකත්වය) සුදුසුකම මෙරටදී ලබා ගැනීමේ පහසුකම් සැළසීමේ අධ්‍යායන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම 2024 වසරේ සිට ආරම්භ කරනු ලැබිණි. ඒ මගින් FGA සුදුසුකම විදේශගත නොවී මෙරටදීම ලබා ගැනීමට හැකි අයුරින් අප ආයතනය හරහා පාඨමාලා හැදෑරීමේ පහසුකම මෙරට පුද්ගලයින්ට හිමි වන අතර ආයතනික ආදායම් උත්පාදනය කිරීමේ කටයුතු මේ හරහාපුළුල් කිරීමේ හැකියාව ඇති වනු ඇත.

5.3.3. මැණික් හා ස්වර්ණාභරණ විෂයය සඳහා උපාධි සුදුසුකම පිරිනැමීම

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මුලික සහතික පත්‍ර හා ඩිප්ලෝමා සුදුසුකම ලබා ගන්නා සිසුන් සඳහා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ උපාධි සුදුසුකම ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය හරහා පිරිනැමීමට අදාල පාඨමාලා සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

5.3.4. පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවයක් පැවැත්වීම

සහතික ප්‍රදානය කිරීමේ උත්සවය මගින් ආයතනික සිසුන්ගේ ජයග්‍රහණ විධිමත් ලෙස පිළිගැනීමෙන් ඔවුන්ව කර්මාන්තයට හඳුනා ගැනීම සහ පෙළඹවීමක් සිදුවේ. මෙමගින් ආයතනය සමඟ සිසුන්ගේ සම්බන්ධතාවය ශක්තිමත් කරන අතර සිසුන්ගේ අධ්‍යයන විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීමෙන් ආයතනයේ කිර්තිමත්භාවය ප්‍රවර්ධනය කරයි. මේ හරහා ක්ෂේත්‍රයට අදාල වෙනත් ආයතනයන් හා පුද්ගලයින් සමගද සම්බන්ධතාවයන් ගොඩනගා ගැනිමට හැකියාව

සැලසෙනු ඇත. සහතිකපත් ප්‍රදානෝත්සවය මගින් අඛණ්ඩ අධ්‍යයන හා වෘත්තීය වර්ධනයට පෙළඹවීමක් ඇති කරනු ලබන බැවින් ආයතනයේ 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා වන සහතිකපත් ප්‍රදානෝත්සවය 2024 දෙසැම්බර් මස 19 වන දින පවත්වන ලද අතර එහිදී සහතිකපත්‍ර ලාභීන් 220 ක් සඳහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල වෘත්තීමය සුදුසුකම් පිරිනැමීමට ආයතනයට හැකිවිය.

5.4. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සංවර්ධනය

5.4.1. තාක්ෂණික වැඩමුළු පැවැත්වීම

මැණික් හඳුනා ගැනීම , මැණික් කැපීම සහ ඔප දැමීම , ගෙවුඩතාප පිරියම් කිරීම යනාදි කේෂ්ත්‍රයට අදාල තාක්ෂණික වැඩමුළු රාශියක් බාහිර ආයතනයන් කේන්ද්‍රක ගනිමින් සිදු කරනු ලැබිණි. ස්වර්ණාභරණ කර්මාන්තයට අදාලව බැංකු ක්ෂේත්‍රයේ ඉහල පුහුණු අවශ්‍යතාවයක්ව පවතින ස්වර්ණාභරණ ප්‍රමිතිකරණය , තත්යංකනය හා ව්‍යාජ රන් භාණ්ඩ හඳුනා ගැනීම සහ රන් භාණ්ඩ උකස් කිරීමේ ක්‍රමවේදයන් සම්බන්ධ පුහුණු වැඩමුළු බැංකු පද්ධතිය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට ද 2024 වසරේදි කටයුතු කර ඇත.

5.5. පුහුණු ලාභින් කර්මාන්තගත කිරීම

2024 වර්ෂයේදි මැණික් ක්ෂේත්‍රය හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාලව බඳවා ගනු ලැබූ පුහුණු ලාභින් 1332 අතුරින් පුහුණු ලාභින් 507 ක ප්‍රමාණයක් 2024 වසර අවසාන වන විට සාර්ථිකව පාඨමාලා හදාරා අවසන් කර ඇත. අනෙකුත් පාඨමාලා තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවති. මෙම සිසුන්ගෙන් කර්මාන්තයේ රැකියා අවස්ථා සඳහා යොමු විමට කැමති සිසුන් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කිර්තිමත් කර්මාන්ත ශාලාවන්හි රැකියා අවස්ථාවන් සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත.

කාර්ය සාධනය

පර්යේෂණ අංශය

6.1 2024 පර්යේෂණ වැඩසටහන්වල ප්‍රගතිය

6.1 ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පවතින මැණික් තැම්පතු ජාතික ආර්ථිකයට දායක කිරීම මෙන්ම 1:50,000 පරිමාණයෙන් යුත් සිතියම් සංචිතයක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වේ. එහිදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අදාළ මැණික් විභව සිතියම හා තාක්ෂණික වාර්තාවක් සකස් කෙරේ.

6.1.1කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මෙම කොට්ඨාශය රත්නපුර දිස්ත්‍රික්කයෙහි දකුණු ප්‍රදේශයට මායිම්ව පිහිටා ඇත. ඇරාපෝරුව ගඟ හා එහි අතු ගංගා ආශ්‍රිත දියළු නිධිය, ආඳාළුව ගඟ දියළු නිධිය, හල්වින්න ප්‍රදේශය ආශ්‍රිත අවශේෂ නිධිය හා ගිනිගල්ගොඩ ප්‍රදේශය ආශ්‍රිත අවශේෂ නිධිය මෙම ප්‍රදේශයෙහි පවතින ප්‍රධාන මැණික් නිධි ලෙස හඳුනා ගනු ලැබීය. මෙම තැන්පතු තුල නිල් කැට, පුෂ්පරාග, ගෙවුඩ, කිරිංචි, තෝරමල්ලි හා ජාගුං වැනි මැණික් වර්ග බහුලව හමුවේ. කොට්ඨාශය පුරාම සක්‍රිය මැණික් පතල් අඩු වශයෙන් දක්නට ඇති අතර අඩි 20-30 දක්වා ගැඹුරු දෝනා රහිත විවෘත පතල් හරහා මෙන්ම අඩි 5-20 පමණ නොගැඹුරු පතල් වලින්ද මැණික් කැනීම සිදු කෙරේ. නමුත් ගිනිගල්ගොඩ ප්‍රදේශය ආශ්‍රිත අවශේෂ නිධියෙහි අඩි 150 පමණ ගැඹුරින්යුතු දෝනා පතල් කැනීම් නිරීක්ෂණය කල හැක.

	
රූපය 01 – කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මූලික මැණික් විභව සිතියම	*රූපය 02 – කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආශ්‍රිත මැණික් නිධි ගවේෂණ කටයුතු*

6.1.2පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මැණික් විභව සිතියම හා වාර්තාව විද්‍යාගාර දත්ත මත පදනම්ව යාවත්කාලීනකිරීම සිදුකර ඇත. දෙනවක් ඔය, වේ ගඟ දියළු නිධි, නීලගම හා මොරතොට ප්‍රදේශ ආශ්‍රිතව අවශේෂ මැණික් නිධි ප්‍රධාන මැණික් නිධි ලෙස හඳුනා ගනු ලැබූ අතර නිල් කැට, රතු කැට, පුෂ්පරාග, ගෙවුඩ, කිරිංචි, තෝරමල්ලි, රබහ හා ජාගුං වැනි මැණික් වර්ග බහුලව හමුවන බවද නිරීකෂණය විය.



රූපය 03 – කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මූලික මැණික් විභව සිතියම



රූපය 04 – පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම

6.1.3අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

මැණික් විභව සිතියම හා වාර්තාව විද්‍යාගාර දත්ත මත පදනම්ව යාවත්කාලීනකිරීම සිදුකර ඇත. කළු ගඟ, ගලතුර ඔය, හීන් ගඟ, පස්ගං ඇල, දියළු නිධි හා පල්ලෙකඩ ප්‍රදේශයේ අවශේෂ මැණික් නිධි ප්‍රධාන මැණික් නිධි ලෙස හඳුනා ගනු ලැබූ අතර නිල් කැට, පුෂ්පරාග, ගෙවුඩ, කිරිංචි, තෝරමල්ලි, රබහ හා ජාගුං වැනි මැණික් වර්ග බහුලව හමුවන බවද නිරීකෂණය විය.



රූපය 05 – අයගම ප්‍රදේශයේ සාම්පලයන්හි විද්‍යාගාර අධ්‍යයන ප්‍රතිඵල



රූපය 06 – අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම

2023 වර්ෂය තුල අවසන් කිරීමට නොහැකිව වූ ඉංගිරිය, දෙහිඕවිට හා කිරිඇල්ල *යන ප්‍රාදේශීය* ලේකම් කොට්ඨාශයන් හි මැණික් විභව සිතියම් සකස් කර එහි වාර්තා සකස් කිරීම අවසන් කර ඇත.



රූපය 07,08,09 – ඉංගිරිය, දෙහිඕවිට හා කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම

මැණික් ගැරුම් වැල්ල තුළ ඉතිරි වන දුර්ලභ පෘථිවි මූලද්‍රව්‍ය, Au සහ අනෙකුත් දුර්ලභ ලෝහ ලබා ගැනීම පිළිබඳ අධ්‍යයනය සඳහා රත්නපුර කළුගඟ සහ මහවැලි ගංගා දෝනි ආශ්‍රිතව ලබා ගත් නියැදි හා කොරන්ඩම් (කුරුවින්ද) සම්භවය පිළිබඳ අධ්‍යයනයක් සඳහා රත්නපුර, කොළොන්න, බුත්තල, ඇලහැර සහ බකමූණ යන ප්‍රදේශ වලින් ලබා ගත් නියැදි විද්‍යාගාර විශ්ලේෂණයේ පවතී.

6.2 <u>ව්‍යාපෘතිය :- මැණික් සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම</u>

6.2.1. **අඳුරු පැහැති මාංගු තෝර තාප පිරියම් කිරීම හා එහි වර්ණය වෙනස්වීම අධ්‍යනය කිරීම.**

දුරු පැහැති මාංගු තෝරමල්ලි (Tourmaline) විවිධ තත්වයන් යටතේ තාප පිරියම් කිරීම් සිදුකර එහි වර්ණයේ වෙනස්වීම් අධ්‍යනය කරන ලදි. මෙම අධ්‍යනයේදී UV – Visible හා FTIR අවශෝෂණය වර්ණාවලින් පෙනී යන්නේ Fe හා Mn අයන වල සංයුජතාවය මෙම තාප පිරියම් කිරීමේදී වෙනස් වන බවත් එබැවින් වර්ණය කහ - තැබිලි වන බවත්ය (රූපසටහන 10).



රූපය 10 - UV – Visible හා FTIR අවශෝෂණය වර්ණාවලිය තාප පිරියම් කිරීමට පෙර හා පසු අවස්ථා දක්වා ඇත.

6.2.2. යං ගෙවුඩ ලක්මිණි උදුන ආධාරයෙන් තාප පිරියම් කර වර්ණය වැඩිදියුණු කිරීමට ඇති හැකියාව අධ්‍යනය කිරීම.

ලංකාවෙන් හමුවන යං ගෙවුඩ 1850OC උපරිම උෂ්ණත්වයෙන් ඔක්සිහාරක තත්වය යටතේ තාප පිරියම් කිරීම පැය 02 කාලයක් සිදුකරන ලදි. පසුව එම නියැදි පිලිවලින් 1300 - 1400OC , 1400 - 1500OC , හා 1500 - 1600OC උෂ්ණත්වයේ පැය 12ක කාලයක් තාප පිරියම් කරන ලදි. පසුව ඒවායේ වර්ණය අධ්‍යනය කරන ලදි. එහිදී UV – Visible අවශෝෂණය වර්ණාවලිය හා FTIR වර්ණාවලියෙන් පෙනී යන්නේ දෙවන තාප පිරියම් කිරීම මගින් වර්ණය අඩු වන බවය(රූපය 11)



රූපය 11 – තාප පිරියම් කිරීමට පෙර හා තාප පිරියම් කිරීම් දෙකෙහි අවශෝෂණ වර්ණාවලිය

6.2.3. Raman අවශෝෂණ වර්ණාවලිය හා අන්වික්ෂීය ඡායාරූප ආධාරයෙන් තාප පිරියම් කිරීමට පෙර වර්ණය නිර්ණය කිරීමේ මොඩලය

ගෙවුඩ කර්මාන්තයේ ඇති ප්‍රධානතම ගැටළුවක් වනුයේ ගෙවුඩයක් තාප පිරියම් කිරීමට පෙර එහි ලැබිය හැකි වර්ණය පුරෝකථනය කිරීමය. මේ සඳහා විවිධ වර්ගයේ ගෙවුඩ 160ක ප්‍රමාණයක් තාප පිරියම් කිරීමට පෙර ඉතා නිර්වද්‍යතාවයකින් යුක්තවූ රාමන් අවශෝෂණ වර්ණාවලිය හා

අන්වීක්ෂීය ඡායාරූප ලබාගන්නා ලදි. පසුව තාප පිරියම් කර එහි වර්ණය GIA වර්ණශ්‍රේණිගත කිරීම් සිදුකරන ලදි. පසුව Pythan ආධාරයෙන් Machine learning මොඩලයක් සකසන ලදි. එහිදී Raman වර්ණාවලි අධ්‍යනයන්ගේ, අන්වීක්ෂීය අධ්‍යනයන්ගෙන් සිදුකරන ලද මොඩලය පිලිවලින් 80% හා 50% ප්‍රතිශතයෙන් සාර්ථක විය. මෙය ඉදිරියටද සිදුකරමින් පවති. රූපය 12 මගින් රාමන් අවශෝෂණ වර්ණාවලිය දක්වා ඇත.



රූපය 12 –රාමන් අවශෝෂණ වර්ණාවලියන් දක්වා ඇත. මෙම දත්තයන් මොඩලය සැකසීමට යොදාගන ඇත.

6.2.4. **නිල් වර්ණය නොලැබෙන ලෙස රතු ගෙවුඩ තාප පිරියම් කිරීම.**

අමතර ඔක්සිජන් තෙවන වායුවක් ලෙස ලක්මිණි උදුන සැපයීම මගින් නිල් වර්ණය නොලැබෙන පරිදි රතු ගෙවුඩ තාප පිරියම් කල හැකි බව තහවුරු කර ගන්නා ලදි. තාප පිරියම් කිරීමට පෙර හා පසු රතු ගෙවුඩ වල වර්ණය වර්ණය වෙනස්වීම රූපය 13 මගින් දක්වා ඇත.



රූපය 13 –රතු ගෙවුඩ තාප පිරියම් කිරීමට පෙර හා පසු අවස්ථා

6.3 <u>ව්‍යාපෘතිය :- මැණික්වල වර්ණ වැඩි දියුණු කිරීම සඳහා තෙවන වායුවක (H2, N2, Ar, CO2) බලපෑම හඳුනා ගැනීම සහ විදුලි උදුන භාවිතයෙන් ගෙවුඩ සඳහා පිරියම් කිරීමේ තත්ත්ව ස්ථාපනය කිරීම</u>

ලක්මිණි උදුන අදාරයෙන් තාප පිරියම් කිරීමේදී තෙවන වායු සැපයීම මගින් තත්වයෙන් අඩු මැණික් වල වර්ණය වර්ධනය කිරීම සඳහා බලපෑම මෙතෙක් විද්‍යාත්මකව අධ්‍යනය කර නොමැත.එබැවින් ඒ සඳහා දැනට මැණික් ක්ෂේත්‍රයේ පවතින ලක්මිණි උදුන නවීකරණය කර (රූපය 14)තෙවන වායුව සැපයීම පිළිබඳව අධ්‍යනය කරමින් පවති.

රූපය 14 –නවීකරණය කරන ලද ලක්මිණි උදුන හා තෙවන වායු සැපයීම් ඒකකය

6.4 <u>අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම.</u>

දෙවන අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය තායිලන්තයේ GIT ආයතනයේ නිලධාරීන්ගේ තාක්ෂණික සහයෝගය හා සහභාගීත්වය ඇතිව 2024.08.02 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහිදී පර්යේෂණ වියුක්ත (Abstracts) 17 ක් ඉදිරිපත් කරමින් ඉතාමත් සාර්ථක ලෙස පවත්වන ලදී.

රූපය 14,15,16 – පර්යේෂණ සම්මන්ත්‍රණය අවස්ථා සහ එහි පර්යේෂණ ග්‍රන්ථය

6.5 <u>ව්‍යාපෘතිය :- නැනෝ තාක්ෂණය යොදා ගනිමින් වර්ණවත් රත්‍රන් මිශ්‍ර ලෝහයක් සෑදීම</u>

රත්තරං නැනෝ අංශු නිපදවීමට නව ක්‍රමවේදයක් හඳුනා ගන්නා ලද අතර ඊට අදාළ රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කරමින් පවතී.

රූපය 04 - වර්ණවත් රත්‍රන් මිශ්‍ර ලෝහයක් සෑදීම සඳහා පර්යේෂණ සිදු කිරීම

6.6 <u>ව්‍යාපෘතිය :- රසායනාගාර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම.</u>

ISO 17025:2017 විද්‍යාගාර ප්‍රතීතනය යටතේ ආයතනික විද්‍යාගාර ප්‍රතීතනය ආරම්භ කර ඇත. මෙහිදී කාර්මික තාක්ෂණික ආයතනයේ උපදේශකත්වය යටතේ අදාල කටයුතු කරමින් පවතින අතර ප්‍රතීතන කටයුතු වෙනුවෙන් ලේඛන කටයුතු අවසන් කර ඉල්ලුම් පත් යොමුකිරීමට නියමිතය. රසායනාගාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ සම්පූර්ණ ක්‍රියාවලිය 2025 තුළ දී අවසන් කෙරේ.

6.7 <u>ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ පවතින තාක්ෂණික හා නිපුණතා හි ඌනතා හඳුනා ගැනීමේ සමීක්ෂණය</u>

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සමඟ මූලික කටයුතු සිදු කරමින් පවතින අතර ඊට අදාළ ප්‍රශ්නාවලිය සැකසීම අවසන් අදියරේ පවතී.

6.8 <u>**ශ්‍රී ලංකාව තුල මැණික් සඳහා වූ සංචාරක ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම පිළිබඳ අධ්‍යයනය.**</u>
මැණික් ක්ෂේත්‍රයට සම්බන්ද පුද්ගලයින් මගින් ප්‍රශ්නාවලි 200 ක් පමණ පුරවා දත්ත ලබාගත් අතර එම දත්ත විශ්ලේෂණ කටයුතු සිදුකරමින් පවතී.

6.9 <u>**ව්‍යාපෘතිය :- ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීම.**</u>

ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ ග්‍රන්ථය ප්‍රකාශයට අදාළ කටයුතු සිදුවෙමින් පවතී. පරිච්ඡේද 05කින් යුක්තවූ මෙම ග්‍රන්ථයේ පරිච්ඡේද 04ක් නිම කර ඇත.

6.10 <u>**ව්‍යාපෘතිය :- වැඩමුළු**</u>

6.10.1. අධිතාක්ෂණික උපකරණ භාවිතයෙන් මැණික් විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව

රත්නවිද්‍යාවේදී අධිතාක්ෂණික උපකරණ භාවිතයෙන් මැණික් විශ්ලේෂණය සිදුකිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් (Workshop on Advanced Instrumental Analysis for Gemmology) මැණික් ආශ්‍රිත කර්මාන්තකරුවන් 12 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් 2024.11.30 හා 2024.12.01 දෙදින ආයතනික අධිතාක්ෂණික විද්‍යාගාරයේදී පවත්වන ලදී. මෙමගින් 2023 වර්ෂය තුලදී රු.176,000.00 ක මුදලක් ආයතනය විසින් උපයා ඇත.

රූපය 17 - අධිතාක්ෂණික උපකරණ වැඩමුළුව

6.10.2. ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව දැනුම ලබාදීමේ වැඩමුළුව

2024 වර්ෂය තුල ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩමුළුව 02ක් පවත්වන ලදී.

- ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩමුළුව - දින 05 - බේරුවල
- ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව තාක්ෂණික දැනුම ලබාදීමේ දෙදින වැඩමුළුව - මහනුවර

ඉහත වැඩමුළුවන්හි ප්‍රතිඵල සාධනීය තත්වයේ පවතින අතර වැඩමුළු ඇගයීම් පත්‍රිකා මගින් එය සනාත කර ඇත. බේරුවල හා මහනුවර යන ප්‍රදේශයන්හි වැඩමුළු, රූපය 18 මගින් පහත දක්වා ඇත.

ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව තාක්ෂණික දැනුම ලබාදීමේ වැඩමුළුව - දින 05 - බේරුවල	ගෙවුඩ තාප පිරියම් කිරීමේ නව තාක්ෂණික දැනුම ලබාදීමේ දෙදින වැඩමුළුව - මහනුවර
රූපය 18 - 2024 වර්ෂයේ පවත්වනු ලැබූ වැඩමුළු	

6.11 ව්‍යාපෘතිය :- ප්‍රකාශන එළි දැක්වීම

- **Jayasinghe, R.M.N.P.K.** 2024. Sedimentology and Geochemistry of Kalu River Gem-Bearing Sediments in Sri Lanka: Implication for Provenance and Paleoclimate, Himanshu Pablications, India. pp. 346-369.

- **Jayasinghe R.M.N.P.K.** 2024. Sedimentology and Geochemistry of Kalu River Gem-Bearing Sediments in Sri Lanka: Implication for Provenance and Palioclimate. Proceedings of International Conference of Department of History, Mohanlal Sukhadia University, Udaipur, Rajastan, India, pp 73.

- **S. Illangasinghe**, H. M. M. Kulasooriya, Y. Zhang, M. Chen, L. V. Ranaweera, N. Jayasinghe. Characterization of a new type of Sinhalite from Sri Lanka: Microscopic Inclusions, 3D Fluorescence Imaging, and Trace Element Analysis. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- K. U. K. Kodikara, U. L. T. S. Randeepa, V. Wickramarathna, **S. Illangasinghe**, C. Wawegedara, N. Jayasinghe. Identification of Potential to Develop Gem Tourism in Rathnapura District, Sri Lanka. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- A. H. P. K. Seenigama, P. G. B. L. Bandara, R. G. C. Jaliya, **S. Illangasinghe**. Raman Spectroscopic Investigation of Fluorescent and Non-Fluorescent Sri Lankan Corundum. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- **S. Illangasinghe**, Y. Zhang, M. Chen, N. Jayasinghe. Colour Zoning in Heat-Treated Geuda Sapphire due to Trace Element Composition. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- V. Wickramarathna, **S. Illangasinghe**, C. Jaliya, C. Arthanayaka. Investigating Heat Treatment Effect on Sri Lankan Black/Brown (Maangu) Tourmaline: A Study of Colour Transformation and Clarity Enhancement. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- P. G. B. R. L. Bandara, A. H. P. K. Seenigama, R. G. C. Jaliya, **S. Illangasinghe**. Differentiating Madagascar and Sri Lankan Low-grade Sapphire using UV-visible spectroscopy. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- S. Diyabalanage, **S. Illangasinghe**, N. Jayasinghe. Application of Geochemical Signature of Sediments to Delinate Gem Potential Area: Preliminary Investigation in Neelagama, Ratnapura, Sri Lanka. *The Gemmologists Association Research Symposium, 30th November 2024, Colombo, Sri Lanka.*

- G. L. H. Ramadasa, **S. Illangasinghe**, N. Jayasinghe, R. M. N. P. Rathnayake, P. D. Mahakumara, N. Ranasinghe, J. Senanayake, H.M.V.T. Welegama, S. Diyabalanage. Potential Detection Method for Gamma-Irradiated Rubies and Pink Sapphires Using UV-Visible and Infrared Absorption Spectroscopy. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

- **S. Illangasinghe**, H. M. M. Kulasooriya, Y. Zhang, M. Chen, L. V. Ranaweera, N. Jayasinghe. Discovery and Characterization of High-Silica Sinhalite (MgAlBO4) in Kiriella, Sri Lanka. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

- P. R. U. S. Jayarathna, M. D. O. R. Jayalal, N. Manthreerathne, S.Illangasinghe, P. Jayasinghe. Enhancing the Beauty of Purple Geuda Spinel from Sri Lanka through Heat Treatment. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

- **M.A.N.C. Manthreerathne**, M.N.M. Rifkhan, A.D.C. De Silva, M.H.M. Shamri, R.M.N.P.K. Jayasinghe. Evaluation of Non-Mercury Methods for Gold Refining in the small scale Jewellery Sector: AComparatibe study. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

- **W.R. Lakshanthi**, M.D.O.R. Jayalal, P.R.U.S. Jayarathna, S.Wijewardhane, Pathmakumara Jayasingha, R.M.N.P.K.Jayasinghe Identification of Potential Gem Tourism Sites and their Geospatial Distribution in Ratnapura District, Sri Lanka; An AHP and GIS approach. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*
- Suneth Neranjan, Pathmakumara Jayasingha, R.M.N.P.K. Jayasinghe, I.K.M.S.C.K. Illangasinghe. Application of Step Frequency Ground Penetration Radar (SFGPR) for Detecting Illegal Underground Tunnel Gem Mining in Ratnapura, Sri Lanka.*The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

.

- D.M. Magalage, W.G.C.N. Wewegedara, R.S. Diyabalanage, R.M.N.P.K.Jayasinghe. Comparative Analysis of Untreated and Heat-Treated Sapphires from Different Localities within Sri Lanka by FT-IR Spectroscopy. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

- M.H.M. Shamri, M.I. Ibrahim, B. Kowarthanan, M.A.N.C. Manthrirathna,R.M.N.P.K. Jayasinghe. Investigating Colour Variation in Sri Lankan Blue Sapphires using Raman Spectroscopy Analysis. *The GJRTI International Research Symposium, 2024. 2nd August 2024, BMICH, Colombo, Sri Lanka.*

6.12. <u>ව්‍යාපෘතිය :- තාක්ෂණික සේවා ලබා දීම</u>

6.12.1. පුද්ගලික ඉඩම් වල මැණික් නිධි ගවේෂණය

බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ප්‍රාදේශීය ලේකම් කෝට්ඨාශයේ වෙලංහින්න ග්‍රාම නිලධාරී වසමේ කිරින්ද ග්‍රාමයේ පිහිටි පේරවත්ත ඉඩමෙහි ගවේෂණ කටයුතු සිදුකරන ලදිග



රූපය 19 - පුද්ගලික ඉඩමෙහි මැණික් නිධිවල පිහිටීම පිළිබඳ අධ්‍යයනය

6.12.2. තාප පිරියම්කරණ සේවා

මුදල් අයකර සිදුකරනු ලබන බාහිර පුද්ගලයන් සඳහා ගෙවුඩ තාප කරණ සේවා ලබාදීම යටතේ ලක්මිණි උඳුන මඟින් සේවා 05 ක් සපයා මෙම වර්ෂය තුල රු.100,000ක ආදායමක් උපයා ඇත..

6.12.3. අධිතාක්ෂණික රසායනාගාර සේවා

රසායනාගාර විශ්ලේෂණ සේවා ලබාදීම යටතේ ED-XRF විශ්ලේෂණ සාම්පල 06ක් හා Raman විශ්ලේෂණ සාම්පල 13ක් මඟින් 2024 වර්ෂය තුලදී රු.98,600.00 ක මුදලක් ආයතනය විසින් උපයා ඇත.

පරිපාලන හා මානව සම්පත් අංශය

7.0 පරිපාලන හා මානව සම්පත් අංශය

7.1 2024.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

තනතුර/ ශ්‍රේණිය		අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	HM 2-1	1	0	1
අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන)	HM 1-1	1	1	0
අධ්‍යක්ෂ (පර්යේෂණ)	HM 1-1	1	0	1
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී (ගවේෂණ)	AR-2	1	1	0
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී (වර්ණය වැඩිදියුණුකිරීම)	AR-2	1	0	1
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී (නවෝත්පාදන)	AR-2	1	0	1
සහකාර අධ්‍යක්ෂ(පරිපාලන හා මානව සම්පත්)	MM 1-1	1	0	1
සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය)	MM 1-1	1	1	0
සහකාර අධ්‍යක්ෂ(වැඩසටහන් හා විෂයමාලා සංවර්ධන)	MM 1-1	1	1	0
සහකාර අධ්‍යක්ෂ(රත්නවිද්‍යා)	MM 1-1	1	0	1
සහකාර අධ්‍යක්ෂ(ස්වර්ණාභරණ)	MM 1-1	1	1	0
පර්යේෂණ නිළධාරී	AR-1	15	3	12
කථිකාචාර්ය	AR-1	4	0	4
වැඩසටහන් නිළධාරී (සම්බන්ධීකරණ හා සංවර්ධන)	JM-1-1	1	1	0
වැඩසටහන් නිළධාරී (විභාග හා සංඛ්‍යාලේඛන)	JM-1-1	1	1	0
අභ්‍යන්තර විගණක	JM-1-1	1	1	0
ජ්‍යෙෂ්ඨ පුහුණු නිළධාරී	JM-1-1	6	0	6
සිතියම් ශිල්පී	MA-2-2	2	0	2
GIS සහායක	MA-2-2	1	1	0
පද්ධති සහකාර	MA-2-2	1	1	0
පර්යේෂණ සහකාර	MA-2-2	11	0	11
තාක්ෂණික සහකාර	MA-2-2	10	1	9
පුහුණු නිළධාරී	MA-2-2	23	13	10
විගණන සහකාර	MA-1-2	1	1	0
කළමණාකරණ සහකාර	MA-1-2	22	15	7
භූ විද්‍යුම් යන්ත්‍ර ක්‍රියාකරු	PL-3	2	0	2
රියදුරු	PL-3	6	5	1
භූ විද්‍යුම් යන්ත්‍ර ක්‍රියාකරු සහායක	PL-2	2	0	2
ක්ෂේත්‍ර හා රසායනාගාර සහායක	PL-1	16	12	4
		136	60	76

පුහුණු වැඩසටහන් සඳහා සේවක සහභාගීත්වය - 2024

දේශීය පුහුණු වැඩසටහන්

#	පුහුණු මධ්‍යස්ථාන	පුහුණු වැඩසටහනේ නම	සහභාගිවන්නන්
1	නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර දින 10ක පාඨමාලාව	අශෝක රාජරත්න මයා කළමනාකරණ සහකාර
2		විනය කළමණාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	සමාධි විතානගේ මිය කළමණාකරණ සහකාර නර්මදා විජේරත්න මෙය විගණන සහකාර
3		Secretarial Practices	භානු හේමචන්ද්‍ර මෙය කළමනාකරණ සහකාර
4		Occupational Health & Safety for better work life environment	රුවින්ද්‍ර චන්ද්‍රකාන්ත මයා පුහුණු නිළධාරී චින්තක දිසානායක මයා පුහුණු නිළධාරී ඩී.ඩබ්. චිත්‍රාංගනී මිය පුහුණු නිළධාරී
5		වාර්ෂික ස්ථාවර වත්කම්, තොග සමීක්ෂණය හා අපහරණය	ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා
6	Prag Institute	Vehicle Fleet Management	කල්පනී පෙරේරා මිය කළමනාකරණ සහකාර
7		Public procurement procedure	කල්පනී පෙරේරා මිය කළමනාකරණ සහකාර
8		Payment & expenditure procedure	පබසරා කුලතුංග මිය කළමණාකරණ සහකාර
9		බදු නීතිය හා බදු ගණනය කිරීම	ධම්මි රූපසිංහ මිය කළමණාකරණ සහකාර
10		Financial Statement 2024	ධම්මි රූපසිංහ මිය කළමණාකරණ සහකාර
11	International Language Center	Tamil Basic Course	සජිත් මුහන්දිරම් මයා නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය)
12	Export Development Board	Awareness programme for gems & jewellery sector SMEs on promoting online presence at EDB E-market place and export procedure	නුවන්ති විජේසිංහ මිය - සහකාර අධ්‍යක්ෂ (වැඩසටහන් හා විෂයමාලා සංවර්ධන)
13	Sri Lanka Accreditation Board	Development of Laboratory Quality Management Systems as per ISO/IEC 17025:2017	නුවන්ති විජේසිංහ මිය - සහකාර අධ්‍යක්ෂ (වැඩසටහන් හා විෂයමාලා සංවර්ධන) නදීකා මන්ත්‍රීරත්න මිය පර්යේෂණ නිළධාරී
14	E –Minds academy (pvt)Ltd.	Digital Marketing Certificate & Diploma	එස්. සුතර්ෂන් මයා පද්ධති සහකාර

DEBT
Savings

මූල්‍ය අංශය

69.928
63.772
44.870
48.991
20.556
31.012
26.417
11.311
12.002

8.0 මූල්‍ය අංශය

8.1 විගණනය කරන ලද පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු

(රු.000)

	2020	2021	2022	2023	2024
මෙහෙයුම් ආදායම්					
භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන	77,973.00	77,060.00	86,996.00	89,119.00	94,992.00
වෙනත් දායක වීම්	29,536.91	22,528.16	19,430.60	27,749.08	27,260.07
පාඨමාලා ගාස්තු	12,409.64	3,542.50	15,529.05	30,820.87	38,194.05
සේවා ගාස්තු ආදායම්	72.5	12.00	246.00	216.00	112.00
භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම්					
මුළු මෙහෙයුම් ආදායම්	**119,992.05**	**103,142.66**	**122,201.65**	**147,904.95**	**160,558.12**
වෙනත් ආදායම්	1,042.83	837.49	1,742.04	3,840.62	1920.98
පොලී ආදායම	457.21	293.71	466.03	632.09	470.42
වෙනත් ලැබීම්	4680.0	1564.0			
මුළු ආදායම	**126,172.10**	**105,837.39**	**124,409.73**	**152,377.66**	**162,949.53**
අඩුකලා - වියදම්					
ඒ. සේවක හා පරිපාලන වියදම්	91,624.36	84,691.33	99,431.65	106,582.99	119,241.81
බී. ක්ෂය සහ පොදු වියදම්	28,208.10	33,251.66	30,297.86	39,997.83	38,788.19
මුළු වියදම්	**119,832.46**	**117,943.00**	**129,729.51**	**146,580.82**	**158,030.00**
අතිරික්තය (ඌණතාවය)	**6,339.64**	**(12,105.1)**	**(5,319.78)**	**5,796.84**	**4,919.53**

8.2 මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂන හා අභ්‍යාස ආයතනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

විස්තරය	2024		2023	
	රු.000	රු.000	රු.000	රු.000
මෙහෙයුම් ආදායම්				
පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර		94,992.00		89,119.00
වෙනත් ආදායම්				
පාඨමාලා ගාස්තු		38,194.05		30,820.87
ගෙවුඩ තාපකරණ ගාස්තු		112.0		216.0
පොළී ආදායම්		470.42		632.09
විවිධ ආදායම්		1,920.98		3,840.62
13 වසරක අඛන්ඩ අධ්‍යාපන වැඩසටහන				
මෙහෙයුම් ආදායම් එකතුව		**135,689.45**		**124,628.58**
අඩු කලා : මෙහෙයුම් වියදම්				
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා		66,135.42		56,341.84
ගමන් වියදම්		230.45		127.19
සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය		5,770.09		4,751.28
නඩත්තු වියදම්		7,171.78		5,641.31
ගිවිසුම් ගත සේවා		32,152.51		32,452.49
පුහුණු වියදම්		5,243.84		4,745.96
වෙනත් මෙහෙයුම් වියදම්		2,488.14		2,482.42
මෙහෙයුම් වියදම් එකතුව		**119,192.26**		**106,542.49**
මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)		**16,497.19**		**18,086.09**
අඩු කළා - මූල්‍ය පිරිවැය		(49.55)		(40.50)
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන	16,712.55		15,201.14	
වෙනත් ලැබීම්				
	16,712.55		15,201.14	
අඩු කළා - ක්ෂය කපා හැරීමේ වියදම්	(28,240.66)	(11,528.11)	(27,449.88)	(12,248.74)
වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන	(10,547.52)		(12,547.94)	
අඩු කළා - ප්‍රාග්ධන ආයෝජන වියදම්	(10,547.52)		(12,547.94)	
ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම්				
වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම		4,919.53		5,796.84
මෙහෙයුම් නොවන ආදායම්				
එකතු කලා වත්කම් විකිණීමෙන් ලද ආදායම				
අති විශේෂ අයිතමයනේට පෙර අතිරික්තය/(ඌනතවය)		4,919.53		5,796.84
අති විශේෂ අයිතම				
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය		4,919.53		5,796.84
එකතු කලා				
පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය)	(43,741.82)		(47,558.85)	
අඩු කලා - පෙර වර්ෂ ගැලපීම්		4,269.15		(1,979.82)
ශුද්ධ අතිරික්තය /(ඌනතාවය)		**(34,553.14)**		**(43,741.82)**

මැණික් හා ස්වර්ණාභරන පර්යේෂන හා අභ්‍යාස ආයතනය
2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

	2024		2023	
විස්තරය	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**
ජංගම නොවන වත්කම්				
දේපල යන්ත්‍ර උපකරණ	90,132.0		99,630.0	
පාරිතෝෂික අරමුදල	4,399.0	94,531.0	3,407.0	103,037.0
ස්ථාවර තැන්පතු ගිණුම්		5274		4846
ජංගම වත්කම්				
තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	8809		7355	
විකිණීම සඳහා ඇති පොත්				
ණය හා අත්තිකාරම්	7563		5538	
තැන්පතු	850		1334	
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්	12693		8718	
දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය				
පෙර ගෙවීම්	266		169	
මුදල් හා බැංකු	24,418	54,599	20,044	43,158
වත්කම් එකතුව		154,404		151,041
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවිය යුතු ගිණුම්	882		5712	
උපචිත වියදම්	9989	10,871	3386	9099
ජංගම නොවන වගකීම්				
Minamata ව්‍යාපෘතිය	780		780	
පාරිතෝෂික සඳහා වෙන්කිරිම්	18,597		14941	
ජාතික විද්‍යා පදනම		19377		15721
වගකීම් එකතුව				24820
ශුද්ධ වත්කම් එකතුව		**124,156**		**126,221**
ශුද්ධ වත්කම් / ස්කන්ධ				
සහභාගීත්ව ප්‍රාග්ධනය	50,000		50,000	
සංචිත	44,646		44,646	
වෙනත් දායක වීම්	850		850	
සේවක වක්‍රිය අරමුදල	2458		2,109	
විලම්භිත ආදායම් - ප්‍රාග්ධන ප්‍රතිපාදන	60755		72,358	
සමුච්චිත අරමුදල	(34,553)		(43,742)	
ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව		**124,156**		**126,221**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය **(රු.000)**

විස්තරය	2024	2023
මෙහෙයුම් කාර්යන්ගේ මුදල් ප්‍රවාහය		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත/ ඌනතාව	**4,919.53**	**5,796.84**
මුදල් නොවන ගනුදෙනු		
ක්ෂය වෙන්කිරීම	28,240.66	27,449.88
පොළී	(470.42)	(632.09)
යන්ත්‍ර,උපකරණ,අලුත්වැඩියා ගැලපීම	(198.24)	
විලම්භිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම්	(27,260.07)	(27,749.08)
අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම /අඩුවීම	1,772.88	4,158.93
කල්බදු කුලී	473.48	473.48
පාරිතෝෂික වෙන්කිරීම	5,049.57	1,692.39
පාරිතෝෂික ගෙවීම	(1,392.65)	(102.15)
අනෙකුත් ජංගම වත්කම් වල වැඩි ටීම	(60.25)	(7,074.80)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)	**11,074.49**	**4,013.4**
ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය		
යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම	(3,914.57)	(6,225.52)
පාරිතෝපික අරමුදලේ වැඩිවීම	(2,400.00)	(2,451.62)
පොළී ආදායම	820.24	883.29
ස්ථාවර තැන්පතු වැඩිවීම	(427.74)	(542.37)
ණය සහ අත්තිකාරම් ගෙවීම	(4,953.33)	
ණය සහ අත්තිකාරම් ලැබීම්	2,871.72	
පාරිතෝපික අරමුදලේ අඩුවීම	1,304.94	
ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)	**(6,698.74)**	**(8,336.2)**
මූල්‍ය කාර්යයන්ගේ මුදල ප්‍රවාහය		
ප්‍රාග්ධන ප්‍රදාන		14,651.0
Minimata ව්‍යාපෘතිය		601.25
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)		**15,252.25**
මුදල් හා මූල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ)	4,375.75	10,929.43
ආරම්භක මුදල් /මූල්‍ය ශේෂය	20,043.12	9,113.68
වර්ෂය අවසානයේ මුදල්/ මූල්‍ය ශේෂය	**24,418.87**	**20,043.11**

මගේ අංකය / எனது இல. / My No. IMT/G/GJRTI/FA/2024 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2025 අගෝස්තු 27 දින

සභාපති,

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ("ආයතනය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජංගම නොවන වගකීම් ලෙස දැක්විය යුතු රු. 2,458,479 ක් වූ සේවක ණය චක්‍රීය අරමුදල් ශේෂය, රු.850,310 ක් වූ අනෙකුත් දායකත්ව හා රු.60,754,680 ක් වූ විලම්බිත ආදායම් ශේෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 95 ඡේදයට පටහැනිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වත්කම්/ හිමිකම් ලෙස දක්වා තිබුණි.

(ආ) පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව වරද සිදුවූ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කල යුතු වුවත් ආයතනය විසින් එකතුව රු.6,157,875 ක් වූ ඉකුත් කාලපරිච්ඡේද වැරදි 13 ක් නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 92 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවමත් භාවිතයේ පවතින පිරිවැය රු.72,606,768 ක් වූ දේපල පිරියත හා උපකරණ වල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි 20 ඡේදය ප්‍රකාරව සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන අයභාරය සහ ආශ්‍රිත වියදම් හඳුනාගැනීම සිදු කළ යුතු වුවත් ආයතනය විසින් පුහුණු පාඨමාලා ආදායම හඳුනාගැනීමේදී ඒ අනුව කටයුතු නොකර පාඨමාලා ආදායම හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,154,360 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද ප්‍රමිතියේ 39(අ) ඡේදය ප්‍රකාරව ආදායම හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය හෙළිදරව්කර නොතිබුණි. පාඨමාලා ලැබීම්වලින් රු.7,232,524 ක් 2025 වර්ෂයට අදාලව ලැබී තිබුණ ද එය කලින් ලද ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබීම නිසා සමාන ප්‍රමාණයකින් අතිරික්තය වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. 2024 වර්ෂයට අදාලව රු.7,281,724 ක් වූ ලැබියයුතු පාඨමාලා ආදායම රු.5,046,250 ක් ලෙස රු.2,235,474 ක් අඩුවෙන් හඳුනාගෙන ගිණුම්ගත කර තිබීමෙන් ජංගම වත්කම් හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.15,657,141 ක ප්‍රාග්ධන ප්‍රධාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව වර්ෂයේ හුවමාරු නොවන ගණුදෙනු වලින් ලද ආදායමක් ලෙස හඳුනා නොගෙන විලම්බිත ආදායම් ලෙස ක්‍රමක්ෂය අඩුකළ අගයට හිමිකම් යටතේ දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 76 ඡේදය ප්‍රකාරව රු.18,597,495 ක් වූ පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධ ප්‍රවර්ථන සේවා පිරිවැයේ වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(උ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආයතනය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියක වියදම අධිකාරිය විසින් ප්‍රතිපූරණය කරනු ලබන අතර වර්ෂය තුළ දරන ලද රු.4,937,034 ක වියදම් සඳහා අධිකාරියෙන් රු.2,543,628 ක් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපූරණය කර තිබුණි. මීට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබූ අතර ව්‍යාපෘතියට අදාල වියදම් හා ලැබෙන ප්‍රදාන පාලන ගිණුමක් හරහා ගිණුම්ගතකර වර්ෂ අවසාන ලැබිය යුතු ශේෂය ලෙස රු.2,015,285 ක් දක්වා තිබුණි.

(ඌ) ආයතනයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය අනුව ප්‍රාග්ධන ප්‍රදානවලට අදාල ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රමාණයට සමානුපාතික ක්‍රමක්ෂය අගයක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට හඳුනා ගනු ලැබිය යුතු වුවද ඒ අනුව කටයුතු නොකර ක්‍රමක්ෂය ලෙස රු.16,712,556 ක් ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයෙන් අඩුකර රු.60,754,680ක් විලම්බිත අදායම් ලෙස හිමිකම් යටතේ දක්වා තිබුණි. තවද විලම්බිත ආදායම් ගිණුමෙන් අඩුකර තිබූ ක්‍රමක්ෂය වටිනාකම රු.16,712,556ක් වුවද වර්ෂයේ ක්ෂය වෙන්කිරීම රු.28,240,553 වීමෙන් රු.11,527,997 ක වෙනසක් පැවතුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.4,944,779 ක් පිරිවැය වූ කාර්යාල ලී බඩු ක්ෂයවීම් රු.1,258,695ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමේදී එක් එක් වත්කම් අයිතමය භාවිතයට ගත් දිනය සහ වටිනාකම පදනම් කරගත යුතු වුවද ඒ වෙනුවට වත්කම් කාණ්ඩය සඳහා ක්ෂය ගණනය කර සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස රු.28,240,553 ක් ගිණුම්වල දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට අස්පෘශ්‍ය වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණ ද එහි වටිනාකම ලෙස රු.3,908,630 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) 2022 සිට 2024 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ජංගම ගිණුමකට සෘජුවම බැර කර තිබූ රු.2,714,164 ක පාඨමාලා ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. ලැබිය යුතු පාඨමාලා ගාස්තු තුළ 2021 වර්ෂයේදී පියවා තිබූ රු.754,000 ක ශේෂයක් ඇතුලත්ව තිබීම හේතුවෙන් ජංගම වත්කම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිඳු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධානයට යොමුව	අනුකූල නොවීම
2022 දෙසැම්බර් මස 14 දිනැති අංක 2310/29 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර තිබුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 01 කොටස 139 වගන්තිය	වැඩ බැලීමේ පත්කිරීමක් වසරක උපරිම කාලයකට සීමා කළ යුතු වුවද අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා වැඩබැලීමේ පත්වීම් ලබාදී 2024 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් වර්ෂ 2 ක් හා වර්ෂ 3 අතර කාලයක් ගතවී තිබුණ ද එම තනතුරු සඳහා සුදුසු නිලධාරීන් ස්ථිරව පත්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍යයන්, කාර්යයන්	අනුකූල නොවීම
1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 25(1)ඊ වගන්තිය, සහ 1995 ජූලි 28 දිනැති අංක 882 දරන ගැසට් නිවේදනයේ (6) වගන්තිය.	ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව පහකට වැඩි නොවිය යුතු වුවද 2025 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 06 ක් විය. එහිදී අධ්‍යක්ෂවරයෙකු ලෙස ගැසට් නිවේදනයෙන් නම් කර නොතිබූ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා රු.14,204,402ක් වැය කර 30 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩමෙහි සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ඉදිකිරීම් ආරම්භ නොකිරීම හේතුවෙන් වසර 08කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

2.3 වෙනත් කරුණු

(අ) ඉහළ යන ඉල්ලුමක් සහිත විෂය ක්ෂේත්‍ර හඳුනා ගනිමින් ඊට අදාළ පුහුණු පාඨමාලා 21 ක විෂයමාලා, සංවර්ධනය කර තිබුණ ද වර්ෂය තුළ ශිෂ්‍යයන් බඳවාගෙන ක්‍රියාත්මක කර තිබුණේ පාඨමාලා 14 ක් සඳහා පමණක් වූ අතර පාඨමාලා 7ක් සඳහා කිසිම අපේක්ෂකයෙකු බඳවාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මෙම පාඨමාලා 14 සඳහා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1577 සිට 1334 දක්වා සියයට 14 කින් අඩුවී තිබුණි. පෙර වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම් හා අලෙවිකරණ පාඨමාලාව, මැණික් මිල තක්සේරුකරණය හා අලෙවිකරණය, ස්වර්ණාභරණ ඩිප්ලෝමාව යන පුහුණු පාඨමාලා පවත්වා නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය

(i) 2024 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය වූ 136 න් 76 ක්, එනම් අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 56 ක් පුරප්පාඩු වී පැවතුණි. එහිදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 22 ක් එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 73 ක්, තෘතීක මට්ටමේ තනතුරු 06 ක් එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 67ක් සහ ද්විතීයික මට්ටමේ තනතුරු 39ක් එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 55ක් ද පුරප්පාඩුව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ අනුමත තනතුරු කාණ්ඩ 12 ක් යටතේ වූ තනතුරු 33ක රාජකාරි ඉටුකිරීමට කිසිදු සේවකයකු නොවුණු අවස්ථා පැවතුණි.

(ii) අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර 2011 ජූනි මස කාර්ය මණ්ඩලය අනුමත දින සිටම පුරප්පාඩු වී තිබූ අතර පර්යේෂණ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩල අතරින් අනුමත ජ්‍යෙෂ්ඨ තනතුරු 19 කින් 15ක් පුරප්පාඩුව පැවතුණි. තවද පර්යේෂණ කටයුතු සඳහා අනුමත මුළු තනතුරු 50 න් 42 ක් එනම් සියයට 84 ක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ ප්‍රධානතම කාර්ය ක්ෂේත්‍රය පර්යේෂණ කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා බාධාවක්ව පැවතුණි.

(iii) ආයතනයේ පුහුණු කාර්යන් සඳහා අනුමත ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී තනතුරු 06 ම, දේශක තනතුරු 04 ම සහ පුහුණු නිලධාරී තනතුරු 23 න් 10 ක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ පුහුණු කාර්යන් ඉටුකිරීම කෙරෙහි අයහපත් අයුරින් බලපා තිබුණි. අධ්‍යක්ෂ (පුහුණු හා සංවර්ධන) තනතුර දරන නිලධාරියා වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත්කර තිබීම හේතුවෙන් ආයතනයේ පුහුණු කාර්යයන් සඳහා ඔහුගේ දායකත්වය ලබාගැනීමට නොහැකිව තිබුණි. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තාක්ෂණික, ශිල්පීය හා වෙළඳපළ අංශයන්ගෙන් වර්තමානයේ විශාල ලෙස පරිවර්තනයට ලක්වී තිබීම හේතුවෙන් ඊට සරිලන අධ්‍යාපන සුදුසුකම්වලින් යුක්ත වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටීම අත්‍යවශ්‍ය වුවද, පුහුණු අංශයේ සේවා නියුක්තව ඇති සේවකයින් වැඩි පිරිසක් සහතික පත්‍ර පාඨමාලා හැදෑරූ සාමාන්‍ය ශිල්පීය කුසලතා සහිත කාර්ය මණ්ඩලයක් වීම හේතුවෙන් නව තාක්ෂණික ක්‍රම හා ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිතව පුහුණු කිරීම් සිදු කිරීම අභියෝගයට ලක්වී තිබුණි.

(ඈ) 2017 - 2031 කාලය තුළ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 300.65 ක් වැයකර සිදු කරගෙන යාමට අපේක්ෂිත ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික් 05ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 50 ක මැණික් නිධි ගවේෂණය සිදුකර වාර්තා සහ සිතියම් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.30,589,687 ක් වැය කර දිස්ත්‍රික් 04 ක පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 ක ගවේෂණ කටයුතු කර භූමි ප්‍රදේශ 17ක පමණක් වාර්තා සහ සිතියම් නිකුත් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉදිරි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ විධිමත් එකගතාවයකට එළඹ නොතිබීම හේතුවෙන් අදාල වාර්තා සහ සිතියම් සහිත ඉඩම් වෙන්දේසි කිරීම සහ බලපත්‍ර ලබාදීම දක්වා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද 2017 සිට 2021 දක්වා කාලය තුලදී ව්‍යාපෘතිය මගින් හදුනාගත් මැණික් විභව ස්ථාන වෙන්දේසියෙන් උපයාගනු ලබන මුදල් රු.මිලියන 174.15 ක් 2022 සිට 2031 දක්වා කාලය තුලදී සිදු කරනු ලබන පර්යේෂණවල දෙවන හා තුන්වන අදියරවල වියදම් දැරීමට පුරෝකථනය කර ඇති නමුත් පර්යේෂණවලින් හඳුනාගත් මැණික් විභව ඉඩම් 2022 හා 2023 වර්ෂවලදී වෙන්දේසි කර ඉන් අදායම් උපයා නොතිබුණි.

(ඇ) මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී රු.10,977,344 කට මිලදී ගත් විදුලි උඳුන් යන්ත්‍රයක් මිලදී ගෙන වර්ෂ 06 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණු අතර 2020- 2021 කාලය තුළ රු.3,953,540 ක මුදලක් දරා අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා යන්ත්‍රය වැඩිදියුණු කර තිබුණි. 2020 - 2021 කාලය තුළ පර්යේෂණ ධාවන වාර 05 කට පමණක් යන්ත්‍රය භාවිතා කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් යන්ත්‍රය අක්‍රියව පැවතුණි.